සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

# තෙවන වාර පරීක්ෂණය 2020
# Third Term Test 2020

11 ශ්‍රේණිය
Grade 11

## චිත්‍ර කලාව - I

පැය එකයි
One hour

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.



01 13 වන සියවසේ ඉදිකර ඇති මෙම දේවාලය ............................................................. ගෘහ නිර්මාණ ලක්ෂණ පෙන්නුම් කරන බව විද්වත් අදහසයි.

02 ශිව දෙවියන් ඇදහීම උදෙසා නිර්මාණය කරන ලද ලෝකඩ මූර්ති රැසක් හමුවන මෙම දේවාලය ............................................................. ශිව දේවාලය ලෙස නම් කර ඇත.

03 මෙහි කුළුණු සඳහා ............................................................. මල් හැඩ යොදාගෙන ඇත.

04 ගොඩනැගිල්ල මුදුනේ ශිඛරය නිර්මාණය කර ඇත්තේ ............................................. මාධ්‍ය භාවිතයෙන් බව ශේෂ ව ඇති සාධක මගින් පෙන්නුම් කරනු ලැබේ.

05 ගෘහ නිර්මාණ ලක්ෂණ අතර මණ්ඩපය, අන්තරාලය හා ..................................................... යනාදියෙන් මෙය සමන්විත වේ.

- **ප්‍රශ්න අංක 06 - 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

06 අජන්තා චිත්‍ර අතර ඉතා විශිෂ්ට නිර්මාණයක් ලෙස සලකනු ලබන පද්මපානි බෝධිසත්ව රූපය දක්නට ලැබෙන ගුහාව කුමක් ද? ..........

07 හෙන්රි මුවර් විසින් නිර්මාණය කරන ලද රජ පවුල නැමති උද්‍යාන මූර්තිය සඳහා භාවිත කරන ලද මාධ්‍ය කුමක් ද? ..........

08 ලොව විශාලතම ෆ්‍රෙස්කෝ සිකෝ සිතුවම ලෙස සැලකෙන ''අවසාන විනිශ්චය'' නම් සිතුවම දක්නට ලැබෙන ස්ථානය කුමක් ද? ..........

09 ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති විනස් ඩි මෙලෝ ප්‍රතිමාව නිර්මාණය කරන ශිල්පියා කවුරුන් ද? ..........

10 දැනට බර්ලින් කෞතුකාගාරයේ තැන්පත් කර ඇති නෙෆර්ටිටි රැජිනගේ රුව නිර්මාණය කරන ලද්දේ මිසරයේ කුමන යුගයක ද? ..........

- **ප්‍රශ්න අංක 11 - 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

11 එම්. සාර්ලිස් ශිල්පියාගේ සිතුවම්වල දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,

(1) අපරදිග / බටහිර ස්වභාවිකවාදී චිත්‍ර ශෛලියේ ආභාසය අනුව රූප රචනය කර ඇත.

(2) පෙරදිග ෂඩංග රීතීන් අනුව වර්ණ හසුරුවා අලංකාර කර ඇත.

(3) ඝනිකවාදී චිත්‍ර ශෛලියේ කලා ආභාසය සහිත ව ඔහුටම ආවේණික චිත්‍ර ශෛලියක් නිර්මාණය කර ගැනීම.

(4) පැතලි තලයක් මත විවිධාකාර හැඩතල සංරචනය කරමින් සිතුවම් නිර්මාණය කර ඇත.

12 පෙළඹවීම (මාර දූවරු) නම් සිතුවම

(1) කතළුව විහාරයේ ඇති මෙම සිතුවමින් බුද්ධත්වය ලැබීම වැළැක්වීම සඳහා මාරදූවරු නිරූපණය කෙරේ.

(2) ස්වභාවික පරිසරය දිය ඇලි, ගස්වැල්, වන සතුන් සමග චමත්කාර ලෙස දැක්වීම.

(3) මාර දූවරු සංගීත භාණ්ඩ වාදනය කරමින් පවත්වන සංදර්ශනයක ස්වරූපයක් මෙමගින් පිළිබිඹු කෙරේ.

(4) වියුක්ත හැඩතල මෙන් ම වර්ණ සංයුතිය ද ඉතා නිර්මාණශීලී ව ඝණිකවාදී ලක්ෂණ මතුවන සේ නිර්මාණය කර ඇත.

13 සීගිරි චිත්‍ර පිළිබඳ විද්වත් මතවාද අනුව එච්. සී. පී. බෙල් මහතාගේ මතය නම්

(1) කාශ්‍යප රජුගේ රජ මාළිගාවට සම්බන්ධ බිසෝවරුන් හා සේවිකාවන් මින් නිරූපණය වන බවයි.

(2) මෙම කාන්තා රූප අප්සරාවන් බවයි.

(3) නිල්වන් ස්ත්‍රීන්ගෙන් මේඝලතා (වලාකුළු) හා රන්වන් ස්ත්‍රීන්ගෙන් විජ්ජුලතා (විදුලිය) නිරූපණය කරන බවයි.

(4) සීගිරිය කුවේරයාගේ ආලකමන්දාව නිරූපණය කරන බවයි.

14 තොළුවිල පිළිමයේත්, විද්‍යාධර ගුහාවේ බුදු පිළිමයේත් කිසියම් සමානත්වයක් දක්නට ලැබෙනුයේ,

(1) ආසන ක්‍රමයේ ය. (2) රැස් මාලාවේ ය.

(3) උන්නත ස්වභාවයේ ය. (4) චීවරයේ ය.

15 සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර අතරින් උද්භිද ගණයට අයත් කල්පිත සැරසිලි යුගලයක් වන්නේ,

(1) සපු මල සහ වැටකේ මල (2) වැටකේ මල සහ මානෙල් මල

(3) කඩුපුල් මල සහ සපු මල (4) කඩුපුල් මල සහ කතිරි මල

● ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති රූපයට වඩාත් ගැළපෙන රූපය ඉදිරියේ ඇති A, B, C, D, E අක්ෂරයට අයත් රූප සටහන් ඇසුරින් තෝරා එයට අයත් ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ දක්වන්න.

16.  ........................................  A

17.  ........................................  B

18.  ........................................  C

19.  ........................................  D

20.  ........................................  E

● ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

21 අනුරාධපුර යුගයට අයත් පන්කුලිය බුද්ධ ප්‍රතිමාව ........................................................ කලා සම්ප්‍රදායට අයත් යයි සැලකේ.

22 ........................................................ මත තෙල් සායම් මාධ්‍යයෙන් නිම කරන ලද තණපිට්ටියේ සිටින මැඩෝනා නැමති සිතුවම වියානාවල කලා කෞතුකාගාරයක ප්‍රදර්ශනයට තබා ඇත.

23 දමිළ ජාතික කාටූන් චිත්‍ර ශිල්පියෙකු වන ........................................................ මහතා ''සිරිත්තිරන්'' නැමති පුවත්පතට කාටූන් නිර්මාණ ඉදිරිපත් කර ඇත.

24 යුද්ධයේ බිහිසුනු බව දක්වෙන විශිෂ්ටතම නිර්මාණයක් වන ගුවර්ණිකා නම් සිතුවම හැඩතල හා වර්ණ යොදා ඇති ආකාරය අනුව ........................................................ ශෛලීය ලක්ෂණ වලින් යුක්ත බව විචාරකයින් පවසයි.

25 ලන්ඩන් ජාතික කලාගාරයේ ප්‍රදර්ශනය කර ඇති පර්වත මස්තකයේ දේවමෑණියෝ නම් සිතුවම ........................................................ විසින් නිර්මාණය කර ඇත.

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු F, G, H, I, J යන රූප සටහන් ඇසුරින් ලියන්න.**


F


G


H


I


J

26 F අක්ෂරයෙන් දැක්වෙන සිතුවම සඳහා භාවිත කර ඇති සැරසිලි ඒකකය හඳුන්වන නම කුමක් ද?

..........................................................................................................

27 G අක්ෂරයෙන් දැක්වෙන කැටයම දක්නට ලැබෙන ස්ථානය කුමක් ද?

..........................................................................................................

28 H අක්ෂරයෙන් දැක්වෙන ප්‍රතිමාව නිර්මාණය කර ඇති ශිල්පක්‍රමය කුමක් ද?

..........................................................................................................

29 I අක්ෂරයෙන් දැක්වෙන මුද්‍රාව හඳුන්වන නම කුමක් ද? ..........................................

30 J අක්ෂරයෙන් දැක්වෙන සිතුවම දක්නට ලැබෙන විහාරය කුමක් ද? ..........................................

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති වචන පැහැදිලි වන සේ වාක්‍ය තනන්න.**

31 මේධිය ..........................................................................................................

32 වයනය ..........................................................................................................

33 නයික් ..........................................................................................................

34 පත්තිරිප්පුව ..........................................................................................................

35 වීරාසන ..........................................................................................................

- **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා දී ඇති ශීර්ෂ යටතේ මෙම කලා කෘතිය කලාත්මක ඇගයීමකට ලක් කරන්න.**



36 ශිල්පියා ..........................................................................................................

..........................................................................................................

37 තේමාව ..........................................................................................................

..........................................................................................................

38 කලා සම්ප්‍රදාය ..........................................................................................................

..........................................................................................................

39 වර්ණ භාවිතය ..........................................................................................................

..........................................................................................................

40 කලා ලක්ෂණ ..........................................................................................................

..........................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

තෙවන වාර පරීක්ෂණය 2020
Third Term Test 2020

11 ශ්‍රේණිය
Grade 11

චිත්‍ර කලාව - II

පැය දෙකයි
Two hours

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කර

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති A4 ප්‍රමාණයේ සුදු කඩදාසිය භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර කඩදාසිය භාවිත කරන්න.

★ මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

★ ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **නිදහස් රේඛා අධ්‍යයනය**
  1. මුල් කඩදාසියේ කරනු ලබ පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා
- **වර්ණ චිත්‍රය**
  2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම.
  3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
  4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දක්වීම.
  5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
  6. උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

| | | |
|---|---|---|
| 1. | රේඛා මගින් කරන ලද පූර්ව අධ්‍යයනයේදී දක්වා ඇති කුසලතා වර්ණ චිත්‍රය | (ලකුණු 05) |
| 2. | ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම. | (ලකුණු 05) |
| 3. | පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය | (ලකුණු 05) |
| 4. | දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දක්වීම. | (ලකුණු 05) |
| 5. | වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා | (ලකුණු 05) |
| 6. | උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව | (ලකුණු 05) |
| | | (මුළු ලකුණු 30) |

සැ.යු.:

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාලව ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැලපෙන අයුරින් වෙනස්කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය 2020
## Third Term Test 2020

11 ශ්‍රේණිය
Grade 11

## චිත්‍ර කලාව - II

* මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 30 ක් හිමිවේ.

අවශ්‍ය ද්‍රව්‍ය පහත පරිදි සපයාගන්න.

- * පෙට්ටියක්
- * බෝතලයක්
- * වර්ණවත් චීත්ත රෙද්දක්
- * මධ්‍යම ප්‍රමාණයේ බෝලයක් (අඟල් 5 ක් හෝ 6 ක විෂ්කම්භයකින් යුක්ත)
- * ක්‍රෝටන් අත්තක් (කොළ පහක් පමණ)

රූපයේ පෙන්නුම් කර ඇති පරිදි ද්‍රව්‍ය කට්ටලය සකසන්න. ඩ්‍රෝයිං ලෑල්ල ඇස් මට්ටමෙන් පහතට වන්නට සකස් කරන්න. මෙහිදී ක්‍රෝටන් කොළ ඇස් මට්ටමට සම විය හැකිය.



සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

**තෙවන වාර පරීක්ෂණය 2020**
**Third Term Test 2020**

| | | |
|---|---|---|
| **11 ශ්‍රේණිය**<br>**Grade 11** | **චිත්‍ර කලාව - III** | **පැය දෙකයි**<br>**Two hours** |

සැලකිය යුතුයි

- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 30 ක් හිමිවේ.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (ෆේල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- පහත ''අ'', ''ආ'' කොටසින් හෝ ''ඇ'' කොටසින් එක් මාතෘකාවක් තෝරා වර්ණවත් චිත්‍රයක් අඳින්න.

---

### "අ" කොටස - චිත්‍ර සංරචනය

01 විවාහ මංගල්‍යයක අසිරිය (මහනුවර සම්ප්‍රදායේ සිතුවම් ශෛලියට අනුව)

02 ගමේ සතිපොළේ සිත්ගත් අවස්ථාවක්

03 ක්‍රීඩා තරගයක උද්වේගකර අවස්ථාවක්

04 අලි බලන්න කැළේ ගිහින්

### ''ආ'' කොටස - මෝස්තර නිර්මාණය

05 මල් සහ කොළ ඇසුරින් රෙද්දක් සඳහා සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න. (අඟල් 9 x 9 ප්‍රමාණයේ කොටුවක් භාවිත කරන්න.)

06 නිදහස් හැඩතල යොදා ආයත චතුරස්‍රාකාර මේස රෙද්දක් සඳහා සුදුසු මුළුතල මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.

07 විදුලි මේස ලාම්පුවකට සැලසුමක් ඇඳ වර්ණ කරන්න.

### ''ඉ'' කොටස - ග්‍රැෆික් චිත්‍ර

08 ''අතරමං වූ අලිපැංචා'' නම් ළමා කතන්දරයට පොත් පිටකවරයක් සැලසුම් කරන්න. (මුල් පිටුව සණකම සහ පසුපිටුව ඇතුළත් විය යුතුයි.)

09 ''මොනවද අම්මේ අකුරු ජාතියක්

පාට පාට මල්වල ලියලා....''

යන ගීතයට සන්නිදර්ශන චිත්‍රයක් අඳින්න. ගීතය හෝ ගීතයේ කොටසක් ඇතුළත් කළ යුතුයි.

10 ''ළමා අයිතීන් සුරකිමු'' යන තේමාව අර්ථවත් වන සේ පෝස්ටර් චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.

## පිළිතුරු පත්‍රය

(01) දකුණු ඉන්දීය
(02) අංක 1
(03) නෙළුම්
(04) ගඩොලින්
(05) ගර්භ ගෘහය
(06) 01 ගුහාව / අංක 01 ලෙනෙහි
(07) ලෝකඩ
(08) රෝමයේ වතිකානු නගරයේ සිස්ටයින් දෙව් මැදුරේ අල්තාරය පිටුපස බිත්තියේ
(09) ඇලෙක්සැන්ඩ්‍රොස් නම් ශිල්පියා
(10) අමර්ණා යුගය / නව රාජධානි සමයේ
(11) 1 - අපරදිග / බටහිර ස්වභාවිකවාදී චිත්‍ර ශෛලියේ ආභාසය අනුව රූප රචනය කර ඇත.
(12) 3 - මාර දූවරු සංගීත භාණ්ඩ වාදනය කරමින් පවත්වන සංදර්ශනයක ස්වරූපයක් මෙමගින් පිළිබිඹු කෙරේ.
(13) 1 - කාශ්‍යප රජුගේ රජ මාළිගාවට සම්බන්ධ බිසෝවරුන් හා සේවිකාවන් මින් නිරූපණය වන බවයි.
(14) 1 - ආසන ක්‍රමයේ ය.
(15) 4 - කඩුපුල් මල සහ කතිරි මල
(16) D
(17) C
(18) A
(19) E
(20) B
(21) ගුප්ත
(22) ලී පුවරුවක් මත
(23) සී. ශිවඥානසුන්දරම් (සිරිත්තිරන් සුන්දර්)
(24) ඝණිකවාදී ශෛලිය
(25) ලියනාඩෝ ඩාවින්චි
(26) සිව් හංස පුට්ටුව
(27) සාංචි තොරණ / සාංචියේ
(28) අධි උන්නත ව නෙළන ලද්දකි / නෙළීම
(29) පශුපති (ශිව) / අං සහිත දෙවියා
(30) දෙගල්දොරුව විහාරයේ
(31) සාංචි ස්තූපයේ ඇති කලා අංගයකි. අඩි 16 ක් උසින් චෛත්‍යය වටා යා හැකි ප්‍රදක්ෂිණා පථය ලංකාවේ ස්තූපවල ඇති පේෂා වළලු වෙනුවට සාංචි ස්තූපයේ දක්නට ඇති අංගයකි.
(32) යම් වස්තුවක මතුපිට ස්වභාවය මේ නමින් හඳුන්වයි.
(33) ජයග්‍රහණය සංකේතවත් කරන ඉපැරණි ග්‍රීක දේවතාවියගේ රුවකි. ඇතීනා දෙවඟනගේ දකුණු අත්ලේ ඇති රුවකි.
(34) දළදා මාළිගයට අයත් ගොඩනැගිලි සංකීර්ණයේ එන සුවිශේෂී වාස්තු විද්‍යා නිර්මාණයකි. අටපට්ටම් හැඩයෙන් යුක්ත නිර්මාණයකි.
(35) බුදුන් වහන්සේ හිඳගෙන සිටින ඉරියව්වකි / වම් පාදය මත දකුණු පාදය තබා පහසු ක්‍රමයට වැඩ සිටීම
(36) ජී. එස්. ප්‍රනාන්දු මහතා විසින් නිර්මාණය කර ඇත.
(37) උළු පෝරණුව නමින් හඳුන්වයි.
(38) යුරෝපීය ස්වභාවිකවාදී ශෛලිය දක්වෙන නිර්මාණයකි.
(39) දීප්තිමත් වර්ණ මාලාවක් ත්‍රිමාණ ලක්ෂණ සහිත ව දියසායම් පදාස ක්‍රමයට ප්‍රකාශනාත්මක ව දක්වා ඇත.
(40) තලය මත රූප සංරචනය කිරීමේ දී පෙරබිම, මැද බිම හා පසුබිම මත රූප පිහිටුවමින් චිත්‍රයේ ගැඹුර හා පර්යාවලෝක ලක්ෂණ සහිත ව නිරූපණය කර ඇත.

| | | | | |
|---|---|---|---|---|
| (I) | - | පත්‍රය සඳහා - ලකුණු | = | 40 |
| (II) | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| (III) | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| | | මුළු ලකුණු | = | 100 |

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

Learn Ordinary Level

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371



LOL.lk
online Book Store
071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




මිට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත් ගෙදරටම ගෙන්ව ගන්න ඔන්ලයින් ඕඩර් කරන්න

WWW.LOL.LK

වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal

NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE BOOK STORE



An evening of fun for young readers